# රැකියා ඇබෑර්තු

## අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත)

## සංවර්ධන නිලධාරී තනතුරු 02 (දෛනික පදනම)

### සංවර්ධන නිලධාරී තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **තනතුර** | : | සංවර්ධන නිලධාරී – දෛනික පදනම |
| **දෛනික වැටුප** | : | රු. 34,870/– මාසික වේතනය + ජීවන වියදම් දීමනාව |
| **අධ්‍යාපන සුදුසුකම්** | : | පිළිගත් විශ්වවිද්‍යාලයක භූගෝල විද්‍යාව/සමාජ විද්‍යාව / කෘෂි විද්‍යාව/ පරිසර විද්‍යාව පිළිබඳ උපාධියක් |

**වයස් සීමාව :**

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන්ට බල නොපැවැත්වේ.

**වෙනත් කරුණු :**

1. බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගේ මූලික වැටුපෙන් 10% ක් සේවක අර්ථ සාධක අරමුදල සඳහා ඔවුන් විසින් ගෙවිය යුතු අතර, 15% ක් සේවක අර්ථසාධක අරමුදල සඳහාද, 3% ක් සේවා නියුක්ත භාර අරමුදල සඳහා ද, අධිකාරය විසින් දරනු ලබයි.
2. බඳවා ගන්නා අයදුම්කරුවන් ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මූල්‍ය රෙගුලාසි, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, ශ්‍රී ලංකා රජය විසින් හෝ බස්නාහිර පළාත් සභාව විසින් පනවා ඇති හෝ විටින් විට පනවනු ලබන නියෝග හා රෙගුලාසිවලට අවනත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :** අපද්‍රව්‍ය කලමනාකරණ අධිකාරියේ සභාපති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, නිසි පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ. (බස්නාහිර පළාතේ පදිංචි අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ)

**ඉල්ලුම් කළයුතු පිළිවෙල :** සිය විස්තර ඇතුළත් කරමින් ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය 2024.06.20 දින හෝ ඊට පෙර, සභාපති, අපද්‍රව්‍ය කලමනාකරණ අධිකාරිය (බ.ප.), තුම්බෝව්ල, කරදියාන, පිළියන්දල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීම වෙනුවෙන් කිසිදු දීමනාවක් ගෙවීමට කටයුතු කරනු නොලැබේ. තවද කිසිදු අයුරකින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට බලපෑම් කිරීම එම තනතුර ලැබීමට නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

**සභාපති, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය,**
**බස්නාහිර පළාත.**

**දු.ක. අංක : 011-3056703, 011-2613151** **2024.06.11**